# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය.

**අභියාචනා අංක:- AAT/202/2020 (NPC)**

එස්.ඔබේසේකර

**අභියාචක**

**එදිරිව,**

ජාතික පොලිස් කොමිෂන් සභාව

**වගඋත්තරකරු**

**දිනය : 2026.01.13**

**ඉදිරියේ දී** **විනිසුරු කේ.ටී.චිත්‍රසිරි (සභාපති)**
**ජේ.ජේ.රත්නසිරි (සාමාජික)**
**එස්.නන්දසේකරන් (සාමාජික)**

පෙනී සිටීම :- අභියාචක සිටී.
අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රජයේ සේවක තිස්ස ගුණතිලක මහතා.
වගඋත්තරකාර ජාතික පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් නියෝජ්‍ය අධ්‍යක්‍ෂ මාලා බස්නායක මහත්මිය.

**-නියෝගය-**

අභියාචක විසින් ඉදිරිපත් කර ඇති 2020.11.26 දිනැති අභියාචනා පෙත්සම මඟින් ඉල්ලා ඇත්තේ, පොලිස්පතිතුමා විසින් අභියාචකට එරෙහිව ලබා දී ඇති විනය නියෝගය අවලංගු කර ඔහුව නැවත සේවයේ පිහිටුවන ලෙසයි. මේ සම්බන්ධයෙන් දෙපාර්ශවය විසින්ම ඔවුනොවුන්ගේ දේශන 2025.06.05 දින ඉදිරිපත් කර ඇත. එසේ කරුණු ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ගුණතිලක මහතා දන්වා සිටියේ අභියාචක විසින් ඔහුගේ අභියාචක පෙත්සම මඟින් ඉල්ලා තිබූ නැවත සේවය ලබා දෙන ලෙසට කරනු ලැබූ ඉල්ලීම ඉවත් කර කර ගනිමින් ඒ වෙනුවට අභියාචක ඉල්ලා සිටින්නේ ඔහුට විශ්‍රාම වැටුප ලබා දෙන ලෙසට නියෝගයක් කරන ලෙසයි.

එම ඉල්ලීම අද දින සලකා බලන ලදී. ඒ අනුව විශ්‍රාම වැටුප ලබා දීම සඳහා මෙම විනිශ්චය අධිකාරයට ඇති බලතල මොනවාද යන්න පරීක්‍ෂා කරන ලදී. ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ, 24:8 වගන්තිය යටතේ

සේවයෙන් පහ කළ අයෙකුට විශ්‍රාම තත්ත්වයට වන හිමිකම ලබා දීම සඳහා, අභියාචනා මණ්ඩලයකට බලතල ඇති බවට සඳහන් කර ඇත. ඒ අනුව එම තත්ත්වය ලබා දීම සඳහා ඇති හැකියාව සලකා බැලීමට අභියාචකට කරුණු ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙන ලදී. ඒ අනුව ඔහු වෙනුවෙන් පෙනී සිටි ගුණතිලක මහතා කරුණු ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඔහු විසින් පහත සඳහන් ඉල්ලීම ඉදිරිපත් කරයි.

"අභියාචක සේවයෙන් පහ කිරීමේ විනය නියෝගය ඉවත් කර නැවත සේවයට පත් කරන ලෙස ඉල්ලා මෙම අභියාචනය ඉදිරිපත් කර ඇත. විනිශ්චය අධිකාරයේදී ඉදිරිපත් වූ කරුණු අනුව සහ අභියාචක දැනට වයස අවුරුදු 54 ඉක්මවන තැනැත්තකු වන හෙයින් සේවයෙන් පහ කිරීම වෙනුවට සානුකම්පිත විකල්පයක් වශයෙන් විශ්‍රාම ගැන්වීමේ නියෝගයක් ලබා ගැනීම සඳහා, විධිප්‍රකාරව ඉල්ලීමක් ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට ඇති අයිතිවාසිකම රඳවා ගනිමින් මෙම අභියාචනය ඉල්ලා අස් කර ගැනීමට අවසර පතමි."

ඉහත ඉල්ලීම සළකා බලා අභියාචකගේ විශ්‍රාම වැටුප් ලබා ගැනීම සඳහා ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත ඉල්ලීමක් කිරීමට ඇති අයිතිවාසිකම ඔහු වෙත රඳවා තබමින්, මෙම අභියාචනය ඉල්ලා අස් කර ගැනීමට අවසර දෙමු. ඒ අනුව මෙම අභියාචනය නිෂ්ප්‍රභා කිරීමට තීරණය කරමු.

අභියාචනය නිෂ්ප්‍රභා කරමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි.

එස්.නන්දසේකරන්
(සාමාජික)

දෙව්මිනි/